# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය
# පෙරමග දශක කණ්ඩායම
# 2019/2020 වර්ෂයේ ප්‍රගති වාර්තාව

වර්ෂ 2019 පෙබරවාරි මස 10 වන දින පවත්වන ලද පෙරමග දශක කණ්ඩායමේ මහා සභා රැස්වීමේදී පහත නම් සඳහන් සාමාජික සාමාජිකාවන් විධායක සභාව සඳහා තේරී පත්විය.

| තනතුර | නම |
|---|---|
| සභාපති | බුද්ධික රොෂාන් මයා |
| ලේකම් | ගයානි ශානිකා කොස්වත්තගේ මිය |
| භාණ්ඩාගාරික | වෙනුර කසුන්සිරි මයා |
| උප සභාපති | සුලක්ෂණ විදුරංග මයා, පෙවින්ද බැලගම මයා, දිලීප තුෂාර මයා |
| උප ලේකම් | දිනේෂා ජයමාන්න මිය, ශමේන්ද්‍ර ධර්මසේන මයා, නිෂාදි රුක්ෂාණි මිය |
| උප භාණ්ඩාගාරික | චමිදු විජයවර්ධන මයා |
| සංවිධායක | ශිවන්ත කොස්වත්තගේ මයා |
| උප සංවිධායක | කසුන් මධුෂංඛ මයා |
| සංස්කාරක | ධනංජ ශෂින්ද ඇල්විටිගල මයා |
| ද්වි වාර්ෂික සංවිධායක | රසික මධුෂංක මයා |
| කාරක සභික - 2001 | චරිතා සෙනෙවිරත්න මිය, අමිල මෛත්‍රීපාල මයා |
| කාරක සභික - 2002 | ගීතික පෙරේරා මයා, අප්සරා මධුවන්ති මිය |
| කාරක සභික - 2003 | දිලිනි ලංකිකා ලියනගේ මිය, වරුණ විජයසේකර මයා |
| කාරක සභික - 2004 | මහවත්තගේ රෝෂන් මධුෂංක මයා, තිළිණි ශ්‍යාලිකා තිලකරත්න මිය |
| කාරක සභික - 2005 | සුමුදු ගීගනගේ මිය, රංග දිලාන් පෙරේරා මයා |
| කාරක සභික - 2006 | මේබලා නදීශානි ප්‍රනාන්දු මිය, ජේ. ඩබ්ලිව්. එන්. සාලින්ද මයා |
| කාරක සභික - 2007 | අරුණි මහේෂිකා මිය, නදීෂා රජිනි මිය |
| කාරක සභික - 2008 | ඩබ්ලිව්. ඒ. ටී. මධුරංගි මිය, යසන්ත ඉන්දීවර මයා |
| කාරක සභික - 2009 | හර්ෂ ප්‍රියන්ත මයා, ගිහාන් චතුරංග මයා |
| කාරක සභික - 2010 | ඉෂානි අනුරුද්ධිකා මිය |
| 2018/2019 හිටපු සභාපති | වගීෂ බැලගම මයා |

2019-03-03 වන දින පැවැති පළමු විධායක සභා රැස්වීමේදී ඩබ්ලිව්. ඒ. ටී. මධුරංගි මහත්මිය පුද්ගලික හේතූන් මත ඉල්ලා අස්වූ නිසා ඇති වූ පුරප්පාඩුව වෙනුවෙන් විධායක සභාවේ බහුතර කැමැත්ත මත 2008 කාරක සභික ලෙස කවින්ද්‍ර කුමාර තිස්ස මහතා විධායක සභාවට තේරී පත්විය.

2010 වර්ෂය නියෝජනය කරන කාරක සභික තනතුර සඳහා පුරප්පාඩුවක් පැවති බැවින් ආර්. එම්. ජී. ටී. රත්නායක මහත්මිය ඒ සඳහා වඩාත් සුදුසු යැයි විධායක සභාවේ බහුතර කැමැත්ත මත තීරණය විය.

2019/2020 පරිපාලන වර්ෂය සඳහා විධායක සභා රැස්වීම් 20ක් පවත්වන ලදී.

**මෙම වර්ෂය තුළදී අප විසින් සිදුකල කාර්යයන් පහත පරිදි වේ.**

## 01. ධර්මපාල - රාහුල වාර්ෂික ක්‍රිකට් තරගාවලිය

අප විද්‍යාලය හා මාතර රාහුල විද්‍යාලය අතර වාර්ෂිකව පවත්වනු ලබන "රන් සිංහයන්ගේ සටන" සඳහා මෙවර සත්කාරකත්වය ලබාදෙනු ලැබුයේ අප විද්‍යාලයයි. මෙම තරගාවලිය පැවැත්වූ දින 03 පුරාවටම අවන්හලක් පෙරමග දශක කණ්ඩායම මගින් පැවැත්වූ අතර, ඒ සඳහා පෙරමග සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක් ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.

තවද අප විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන්ගේ නිල ඇඳුම් සඳහා ද අප විසින් අනුග්‍රාහකත්වය දැක්වූ අතර ඒ සඳහා රුපියල් 48,850.00 ක මුදලක් වැයවුනි.

## 02. පෙරමග සාමාජික ප්‍රවර්ධන වැඩසටහන

පෙරමග සාමාජිකත්ව ප්‍රවර්ධනය උදෙසා සකස් කරන ලද සාමාජිකත්ව කුඩය හා කැනපිය 2005 හා 2008 කණ්ඩායම් වල පූර්ණ අනුග්‍රහය යටතේ අප සංගමය වෙත ලබා දෙන ලදී. මෙහි මූලික අරමුණ වනුයේ පෙරමග සන්නාමය හා සාමාජික සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීමයි.

## 03. පෙරමග සඟරාව

පෙරමග සන්නාමය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම, සාමාජිකයන්ගේ නිර්මාණ කුසලතා එළිදැක්වීමට ඉඩහසර ලබාදීම, පෙරමග කණ්ඩායම මඟින් මෙතෙක් සිදු කර ඇති ව්‍යාපෘතීන් හා සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘතීන් පිළිබඳව සාමාජිකයින් දැනුවත් කිරීම යනාදී අරමුණු පෙරදැරිව එළිදක්වන ලද පෙරමග සඟරාව සාමාජිකයන් අතර ඉමහත් ජනාදරයට ලක්වූවකි. අප සාමාජික සාමාජිකාවන් විශාල පිරිසකගේ ශ්‍රම හා බුද්ධිමය දායකත්වයෙන් එළිදක්වන ලද මෙම සඟරාව සඳහා රුපියල් 32,000.00 මුදලක් වැය විය.

## 04. පරිගණක විද්‍යාගාරය අසල දැල් වැට ප්‍රතිසංස්කරණය කිරීම.

බොහෝ කුඩා දරුවන් ගමන් කෙරෙන මාර්ගයක පිහිටි මෙම අනාරක්ෂිත දැල් වැට සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම මෙහිදී සිදු කෙරිනි. එමෙන්ම එම මාර්ගයේ බිම් ගල් ඇතිරීමද මෙයට සමගාමීව සිදුකෙරිනි. දරුවන්ගේ ආරක්ෂාවට මුල් තැන දෙමින් සිදුකල මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් 226,220.00 මුදලක් වැය විය.

## 05. පෙරමග පොකුර

සාමාජික දත්ත නිසි පරිදි පරිගණක ගත කර අවශ්‍ය තොරතුරු උවමනා විටදී ලබා ගැනීම සඳහා සිදු කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ දත්ත ගබඩාවක් සකස් කිරීම සිදුවිය. එම මෘදුකාංගය මේ වන විටත් සංවර්ධනය වෙමින් පවතින අතර ඒ සඳහා දත්ත එකතු කිරීමේ කාර්යය වෙනුවෙන් අප සාමාජිකයින් දැඩි කැපවීමකින් ක්‍රියා කරන ලදී. මෙම මෘදුකාංගය අප පෙරමග සාමාජිකයකු විසින්ම සකස් කිරීම ආඩම්බරයට කරුණකි. එසේම මෙහිදී සාමාජික සාමාජිකාවන්ගේ වෘත්තිමය තත්ත්වය අනුව දත්ත ගබඩා කිරීම සිදු කෙරෙන බැවින් සාමාජික සාමාජිකාවට වෘත්තීමය රැකියා අවස්ථා උත්පාදනය කර දීමට අවස්ථාවක් ලැබේ.

එසේම අප කණ්ඩායමේ ප්‍රයෝජනය සඳහා Portable Hard Disk එකක් මිලදී ගන්නා ලදී.

## 06. ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය

අප පෙරමග කණ්ඩායම විසින් පෙර වසර වල මෙන් මෙම වසරේදී ද පාසලේ උන්නතිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය සොයාගැනීම වෙනුවෙන් 2019-08-17 වන දින ***Wayo live in concert*** අනාගතයේ සංගීත ප්‍රසංගය මරියසෙල් ගුණතිලක මහත්මියගේ හා ශිහාන් මිහිරංග මහතාගේ ගායනයෙන් හැඩ වැඩ වී මහරගම තරුණ සේවා සභා ප්‍රධාන ශාලාවේදී අති සාර්ථකව පැවැත්විනි. මෙම ප්‍රසංගය සඳහා අප සාමාජික සාමාජිකාවන් දැඩි කැපවීමකින් හා උනන්දුවෙන් සහභාගි විය. මෙහිදී අප ඉපැයූ ශුද්ධ ලාභය රු. 2,500,000.00 පමණ වේ.

## 07. 6-9 ශ්‍රේණි සඳහා ඉදිකළ වැසිකිලි පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම

2018/2019 වසරේදී අප සංගමය විසින් සිදු කල ප්‍රධාන ව්‍යාපෘතිය වූයේ 6-9 ශ්‍රේණි සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමයි. එය සැම දෙනාගේම පැසසුමට ලක් වූ ව්‍යාපෘතියකි. 2019 වසර තුලදී එම වැසිකිලි පද්ධතියේ අළුත්වැඩියා කටයුතු කිහිපයක් සිදු කල අතර, විද්‍යාලයට ලබා දුන් එම සම්පත මතු ප්‍රයෝජනය සඳහා නිසි පරිදි නඩත්තු කිරීම මෙහි අපේක්ෂාව විය. ඒ සඳහා රුපියල් 24,900.00 මුදලක් වැය විය.

## 08. ගණිත චිත්‍රාගාරය

තවත් පෙරමග පරිත්‍යාගයක් වූ ගණිතාගාරය "ගණිත චිත්‍රාගාරය" ක් දක්වා වැඩිදියුණු කිරීම මෙහිදී සිදු විය. ඒ අනුව මෙහි තීන්ත ආලේප කිරීම, වායු සමීකරණ 2ක් ස්ථාපිත කිරීම, ගුරු පුටුවක් හා ගුරු මේසයක් ලබා දීම, සිසු මේස පුටු ස්ටිකර් අලවා අවශ්‍ය පරිදි සකස් කිරීම, පිටත බිත්ති අලංකාර සිතුවම් යොදා නිම කිරීම ආදි වූ කාර්යයන් මෙහිදී සිදුවිය. ඒ සඳහා පෙරමග සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක් ශ්‍රම දායකත්වය ලබා දුනි. පිටත බිත්ති අලංකාර සිතුවම් අප පෙරමග සාමාජිකයකු විසින්ම නිර්මාණය කිරීම ආඩම්බරයට කරුණකි. ඒ සඳහා රුපියල් 274,760.00 මුදලක් වැය විය.

## 09. පෙරමග විදුජය

උසස් පෙළ විද්‍යා හා ගණිත විද්‍යාගාර සඳහා අවශ්‍ය විද්‍යාත්මක උපකරණ හා රසායන ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම මෙහිදී සිදුවිය. විද්‍යාගාර වල භෞතික සම්පත් වැඩිදියුණු කිරීම මඟින් සිසු දරුවන්ගේ උසස් පෙළ ප්‍රතිඵල සාධනීය වෙනසක් ඇති කිරීම මෙහිදී අරමුණු විය. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් 300,000.00 කට ආසන්න මුදලක් වැයවිය.

## 10. සය සාමාජික ක්‍රිකට් තරගාවලිය

පෙරමග කණ්ඩායම ආරම්භයේ සිටම අඛණ්ඩව පවත්වාගෙන පැමිණි සය සාමාජික ක්‍රිකට් තරගාවලිය මෙම වසරේදීද 2019-12-22 වන දින විද්‍යාලයීය ක්‍රීඩා පිටියේදී විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අති සාර්ථකව පැවැත්විය. ආදි සිසු සිසුවියන්ගේ සුහදත්වය වර්ධනය හා සාමාජික ප්‍රවර්ධනය මෙහි මූලික අරමුණ විය.

## 11. අබලන් ඩෙස් පුටු පිළිසකර කිරීම

අදියර 3ක් යටතේ සිදු කල මෙම ව්‍යාපෘතිය හරහා අබලන්ව පැවති ඩෙස් පුටු විශාල සංඛ්‍යාවක් අලුත්වැඩියා කර විද්‍යාලයට භාර දීම සිදුවිය. මෙම භෞතික සම්පත් විනාශ වීමට ඉඩ නොදී ඉදිරි පරපුරටත් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අළුත්වැඩියා කිරීම සැමගේ පැසසුමට භාජනය විය. ඒ සඳහා රුපියල් 109,158.00 මුදලක් වැය විය.

## 12. වාර්ෂික ක්‍රිකට් තරඟාවලියේ හොඳම පිතිකරුවා සහ පන්දු යවන්නා හට ක්‍රීඩා උපකරණ ලබා දීම

මෙම වසරේදී ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉහල දක්ෂතා දැක්වූ දරුවන් දෙදෙනෙකු හට ක්‍රිකට් පිත්තක් හා සපත්තු යුගලක් ලබා දීම මෙහිදී සිදු විය. එම උපකරණ සඳහා පෙරමග සාමාජිකයකු විසින් ලබා දුන් දායකත්වය අගය කල යුතුය. හොඳම පිතිකරුවා සඳහා රුපියල් 23,000.00 ක් වටිනා ක්‍රිකට් පිත්තක්ද, රුපියල් 10,000 ක් වටිනා පාවහන් යුගලක්ද ලබාදුනි.

## 13. වාර්ෂික සුහද හමුව

සාමාජිකයින් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කරනු ලබන සුහද හමුව මෙවරත් වාද්දුව River View හිදී පැවැත්විණි. මේ සඳහා සාමාජිකයින්ගේ පවුල් වල සාමාජිකයින්ද එක්ව සිටි අතර තම පාසල් මතකය ආවර්ජනය කරමින් සතුටින් ගත කල එම දිනය සියලු දෙනාට අමතක නොවන දිනයක් විය.

## 14. පෙරමග කුසලානය

විද්‍යාලයේ Netball ක්‍රීඩා කරන දැරියන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම සඳහා සංවිධානය කරන ලද Mini Netball තරඟාවලිය සඳහා මූල්‍යමය අනුග්‍රහය අප විසින් ලබා දුන් අතර ජයග්‍රාහකයින් හට "පෙරමග කුසලානය" ලබා දෙන ලදී. මෙහි මූලික අරමුණ වූයේ ක්‍රීඩා කටයුතු සඳහා දරුවන් උනන්දු කිරීම හා පෙරමග නාමය ප්‍රවර්ධනය කිරීමයි. ඒ සඳහා රුපියල් 64,253.50 මුදලක් වැය විය.

## 15. විද්‍යාලයීය ප්‍රධාන ගේට්ටුවේ සිට ප්‍රධාන ශාලාව දක්වා වූ දැල් වැට ප්‍රතිසංස්කරණය කිරීම

මව් සංගමයේ ඉල්ලීම පරිදි විද්‍යාලයීය ප්‍රධාන ගේට්ටුවේ සිට ප්‍රධාන ශාලාව දක්වා වූ දැල් වැට ප්‍රතිසංස්කරණය කිරීම පෙරමග සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් කඩිනමින් සිදුකරන ලදී.

## 16. ආර්ථික අපහසුතා ඇති දරුවන් හට ශිෂ්‍යත්ව ලබා දීම

පෙරමග අතුරු මහා සභාවේදී යෝජනා ස්ථිරත්වයෙන් සම්මත වූ පරිදි රුපියල් ලක්ෂ 40ක ස්ථාවර තැන්පතුවෙන් මාසිකව ලැබෙන පොලී මුදලින්, පාසල් විෂය සමගාමී හා විෂය බාහිර කටයුතු සඳහා දක්ෂතා දක්වන ආර්ථික අපහසුතා ඇති සිසු දරුවන් හට විදුහල්පතිතුමාගේ නිර්දේශය මත මාසිකව ශිෂ්‍යත්ව ලබාදීම සිදුවේ. මේ සඳහා මාසිකව රුපියල් 30,000.00 මුදලක් වැය වේ.

## 17. ආදි ගුරු සංගමය වෙනුවෙන් දැක්වූ දායකත්වය

ආදි ගුරු සංගමයේ ඉල්ලීම පරිදි දැනට විශ්‍රාම සුවයෙන් පසුවන ගුරු මව් පියවරුන්ගේ දුරකථන නාමාවලියක් මුද්‍රණය කිරීම සඳහා මූල්‍යමය අනුග්‍රහය අප විසින් ලබා දෙන ලදී. මේ සඳහා රුපියල් 7,500.00 මුදලක් වැය විය.

## 18. රගර් ක්‍රීඩාව සඳහා දැක්වූ දායකත්වය

2019 ජනවාරි මස සිට 2019 ජූලි මස දක්වා රගර් ක්‍රීඩකයින්ගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම සඳහා මාසිකව රුපියල් 5,000.00 මුදලක් ලබා දුන් අතර වයස අවුරුදු 19න් පහළ සමස්ත ලංකා අන්තර් පාසල් සත් සාමාජික රගර් තරඟාවලිය සඳහා රුපියල් 22,000.00 මුදලක් ලබා දෙන ලදී. ආදි රගර් කණ්ඩායම මඟින් පැවැත්වූ තරඟාවලිය සඳහා ටිකට් පත් අලෙවියෙන් ද දායකත්වය ලබා දෙන ලදී.

## 19. රුවන් වැකි සහිත නාම පුවරු ප්‍රදර්ශනය කිරීම

පෙරමග කණ්ඩායම විසින් පෙර වසරකදී සිදු කල ව්‍යාපෘතියක් වූ මේ යටතේ රුවන් වැකි සහිත නාම පුවරු අළුත්වැඩියා කිරීම හා නව පුවරු ප්‍රදර්ශනය කිරීම සිදු කෙරේ. දරුවන්ගේ ආකල්ප වර්ධනය කිරීමෙහිලා යහපත් දායකත්වයක් ලබාදීම මෙහි අපේක්ෂාව වේ. මේ සඳහා රුපියල් 138,150.00 මුදලක් වැය විය.

## 20. ප්‍රධාන ශාලාවේ අළුත්වැඩියා කටයුතු සඳහා පෙරමග දායකත්වය

දැනට කඩිනමින් වැඩ කටයුතු අවසන් වෙමින් පවතින ප්‍රධාන ශාලාවේ වැඩ කටයුතු නිම කිරීම සඳහා විදුහල්පතිතුමන්ගේ හා ආදි ශිෂ්‍ය මව් සංගමයේ ඉල්ලීම පරිදි, ප්‍රධාන ශාලාවේ ඇතුලත හා පිටත බිත්ති වල කපරාරුව හා ප්‍රවේශ කුටියෙහි සම්පූර්ණයෙන් වැඩ නිම කිරීමට පෙරමග කණ්ඩායම මඟින් මූල්‍යමය දායකත්වය ලබා දෙන ලදී. මෙම පරිපාලන වර්ෂයේදී, 'පොඩි වල' (එළිමහන් රංග පීඨය) ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය මගින් අරමුදල් රැස්කල අතර එම අරමුදල් විදුහල්පතිතුමාගේ සහ ආදි ශිෂ්‍ය සංගමයේ ඉල්ලීම පරිදි ප්‍රධාන ශාලාවේ අලුත්වැඩියා කටයුතු සඳහා යොදවන ලදී. මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් 2,000,000.00 කි.

## 21. ප්‍රාථමික අංශයේ සෙල්ලම් මිදුල සඳහා පෙරමග දායකත්වය

ප්‍රාථමික අංශයේ සෙල්ලම් මිදුල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ දී එම ව්‍යාපෘතියේ ගුණාත්මකභාවයට ගැටලුවක් වූ සෙල්ලම් මිදුල අසල ඇති ගොඩනැගිල්ලෙහි අළුතින් වැහි පිළි යොදන ලදි. මේ සඳහා රු 49,500.00 මුදලක් වැය විය.

## 22. පාසල ඉදිරිපිට ඇති දැන්වීම් පුවරු ප්‍රතිසංස්කරණය කිරීම

16' x 14' ප්‍රමාණයේ කටවුට් ප්‍රදර්ශනය කිරීම සඳහා වූ දැන්වීම් පුවරු 02ක් ප්‍රතිසංස්කරණය කිරීම පෙරමග සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් කඩිනමින් සිදුකරන ලදි. මේ සඳහා රු. 75,215.00 මුදලක් වැය විය.

## 23. විෂයානුබද්ධ පොත් පත් පාසල් ළමුන් හට ලබාදීම

විදුහල්පතිතුමන්ගේ අනුමැතිය පරිදි තෝරා ගත් පාසල් ළමුන් හට විෂයානුබද්ධ පොත් පත් ලබාදීම සිදු විය. එම පොත්පත් සඳහා පෙරමග සාමාජිකයකු විසින් අනුග්‍රහය දක්වන ලදී. මේ සඳහා රුපියල් 25,000.00ක් පමණ වැය විය.

## 24. ආදි ශිෂ්‍ය මව් සංගමයට, දශක කණ්ඩායම් හා අනු කණ්ඩායම් සඳහා දායකත්වය

ආදි ශිෂ්‍ය මව් සංගමය මඟින් පැවැත්වූ Black & White සුහද හමුව සඳහා මූල්‍යමය, බුද්ධිමය හා ශ්‍රම දායකත්වය හැකි උපරිමයෙන් අප සාමාජික සාමාජිකාවන් විසින් ලබා දෙන ලදී.

අනෙකුත් දශක කණ්ඩායම් මඟින් පවත්වන ලද සංදර්ශන සඳහා (අරලිය- සුසර ගී රාවය, අරුණළු - රසෝඝය, සියසර - පැදුරු සාජ්ජය) සඳහා මූල්‍යමය දායකත්වය සහ හැකි උපරිම සහයෝගය ලබා දෙන ලදී.

එමෙන්ම අරලිය කණ්ඩායම මඟින් වාර්ෂිකව පවත්වනු ලබන වෛද්‍ය කඳවුර සඳහා අප සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.

දශක කණ්ඩායම් හා අනු කණ්ඩායම් මඟින් (සියසර කණ්ඩායම/ ආදි නෙට්බෝල් කණ්ඩායම) පැවැත්වූ ලොතරැයි දිනුම් ඇදීම් සඳහා දායකත්වය ලබා දෙන ලදී.

## 25. විදුහල්පතිතුමාගේ ඉල්ලීම පරිදි ඉටු කළ කාර්යයන්

- පාසලට අවශ්‍ය වූ හැඳුනුම්පත් මුද්‍රණ යන්ත්‍රයක් ලබා දීම. මේ සඳහා රුපියල් 150,000.00 මුදලක් වැය විය.
- පාසලේ ක්‍රීඩාවන් සඳහා දක්ෂතා දැක්වූ දරුවන් වෙනුවෙන් පැවැති Colours Night සඳහා රුපියල් 50,000.00 මුදලක් ලබා දෙනු ලැබිනි.
- පාසලේ ගුරුවරුන්ගේ සුභසාධක සංගමයට ආධාර පිණිස පැවැත්වූ ගුරු සංකලන ප්‍රසංගය සඳහා රුපියල් 10,000.00 මුදලක් ලබා දෙනු ලැබිනි.
- ධර්මපාල ගුණානුස්මරණ දානමය පිංකම සඳහා රු. 10,000.00ක මුදලක් ලබාදෙනු ලැබිනි.

## 26. අපගේ ස්තුතිය

- විදුහල්පතිතුමා, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ආචාර්ය මණ්ඩලය සහ පාසල් සංවර්ධන සමිතියෙන් ද ලැබුණු සහයෝගය අගය කොට සලකමු.
- තවද අපගේ මව් සංගමයේ නිලධාරීන් ඇතුලු සාමාජික සාමාජිකාවන්ගෙන් සැමදා ලැබෙන සහයෝගය සෙනෙහසින් සිහි කරමු.
- අප කණ්ඩායමේ සියලු කටයුතු වලදී ඉමහත් කැපවීමෙන් සංග්‍රහ කටයුතු සිදුකළ මිත්‍රත්ව සංසදයේ සියලු සාමාජික සාමාජිකාවන්ට අපගේ හද පිරි ස්තුතිය පිරිනමමු.
- අප ආදි සිසු කාර්යාලයේ කාර්යය මණ්ඩලය ඇතුලු සහයෝගය ලබා දුන් සැමට අප කණ්ඩායමේ ගෞරවාන්විත ස්තුතිය පළ කර සිටිමු.

මෙයට,
විධායක සභාව වෙනුවෙන්

ගයාති කොස්වත්තගේ
ප්‍රධාන ලේකම්
2020/02/01